ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1984 අංක 25 දරන
# පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

## 1984 අංක 25 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 57/83.

**පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 25 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— 383 වන අධිකාරයේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ පාර්ලිමේන්තුවේ අධිකාරය යටතේ පළ කරන ලද වාර්තා ආදිය පළ කිරීම සඳහා සහ ඒවායේ පිටපත් හෝ එසින් ගත් උධෘත පළ කිරීම සඳහා ආරක්ෂාව.

19. (1) යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ සේවකයා විසින් හෝ—

(අ) පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය පරිදි හෝ එහි අධිකාරය යටතේ පළ කරන ලද වාර්තාවක්, පත්‍රිකාවක්, කාර්ය සටහනක්, සම්මත හෝ කටයුතු වන වාර්තාවක්, පත්‍රිකාවක්, කාර්ය සටහනක්, සම්මත හෝ කටයුතු; හෝ

(ආ) එවැනි යම් වාර්තාවක, පත්‍රිකාවක, කාර්ය සටහනක, සම්මතවල හෝ කටයුතුවල පිටපතක්

පළ කිරීම සඳහා හෝ පළ කිරීම වෙනුවෙන් හෝ පළ කිරීම සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල විත්තිකරුවකු වන ඒ තැනැත්තා විසින් පැමිණිලිකරුට හෝ චෝදකට තම අදහස පිළිබඳ පැය විසි හතරක දැනුම් දීමකින් පසු—

(i) (අ) ඡේදයෙහි සඳහන් පළ කිරීමක් සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් වන විට, ඒ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය වෙත, ඒ නඩු කටයුතු ඇවරීමට සම්බන්ධ වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු ඒ තැනැත්තා හෝ ඔහුගේ සේවකයා විසින්, පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය හෝ අධිකාරය යටතේ පළ කරන ලද බව ප්‍රකාශ කෙරෙන කථානායකවරයාගේ හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ

(ii) (ආ) ඡේදයෙහි සඳහන් පළ කිරීමක් සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් වන විට, ඒ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය වෙත, ඒ නඩු කටයුතු පවරන ලද්දේ යම් පිටපතක් සම්බන්ධයෙන් ද ඒ පිටපත සහ ඒ පිටපත යයි කියනු ලබන වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු සහ ඒ වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු සහ ඒ පිටපතේ නිවැරදි බව සත්‍යායනය කෙරෙන දිවුරුම් පත්‍රයක් ද සමග

ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවිට, ඒ අධිකරණය විසින්, ඒ සිවිල් හෝ අපරාධ නඩු කටයුතු වහාම නතර කරනු ලැබිය යුතු අතර, ඒ නඩු කටයුතු සහ එහි ලා නිකුත් කරන ලද සෑම අධිකරණ නියෝගයක් ම අවසානාත්මකව නිරණය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ සේවකයා විසින්—

(අ) පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය පරිදි හෝ අධිකාරය යටතේ පළ කරන ලද යම් වාර්තාවකින්, පත්‍රිකාවකින්, කාර්ය සටහනකින්, සම්මතවලින් හෝ කටයුතුවලින් ලබාගත් යම් උධෘතයක් හෝ එහි උපුටනයක් ;

(ආ) පාර්ලිමේන්තුව විසින් පළ කිරීම සඳහා බලය දෙන ලද කටයුත්තක් වන පාර්ලිමේන්තුවේ යම් කටයුතු පිළිබඳ සාධාරණ හා නිවැරදි වාර්තාවක්

සද්භාවයෙන් සහ ද්වේශයෙන් තොරව පළ කිරීම සඳහා හෝ පළ කිරීම වෙනුවෙන් හෝ පළ කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලට ඒ තැනැත්තා යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා " සිවිල් හෝ අපරාධ නඩුකටයුතු " යන යෙදුමට, ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකරණයට හෝ මහාධිකරණයට හෝ වෙනත් යම් අධිකරණයකට, විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට හෝ අපහාස කිරීමේ දඬුවම සඳහා වූ යම් නඩුකටයුතු

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක්